# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2068/47 - 2018 අප්‍රේල් මස 28 වැනි සෙනසුරාදා - 2018.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛන අංක I හි සඳහන් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, උපලේඛන අංක II හි සඳහන් මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, උපලේඛණ අංක III හි සඳහන් පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන් හැර එම උපලේඛයන්හි II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයන් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි

**පාඨලී චම්පික රණවක** (පා. ම.),<br>
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 06 වැනි දින.<br>
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,<br>
17 සහ 18 වන මහල්,<br>
''සුහුරුපාය'',<br>
ශ්‍රී සුභූතිපුර පාර,<br>
බත්තරමුල්ල.


1A - PG 4017 — 67 (2018/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### *කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍ර අනුව, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කළ අංක 38/16 හා 1979.06.01 වැනි දින දරන *ගැසට් නිවේදනයෙන්* සඳහන් ප්‍රදේශවලට අමතරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

**උතුරට :**

අංක 1255 තඹරාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිමත්, අංක 778 විල්ගම්දෙමටාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිමත් ඡේදනය වන ලක්ෂයෙන් පටන් ගෙන, එතැන් සිට, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන්කර මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන, දකුණ, ගිණිකොන, නිරිත දෙසට ගමන් කර, එතැන් සිට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට ගමන්කර, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**නැගෙනහිරට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගිණිකොන, දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන, දකුණ, ගිණිකොන, නිරිත හා ගිණිකොන දෙසට ගමන්කර එතැන් සිට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන, නිරිත, ගිණිකොන, දකුණ, ගිණිකොන දෙසට ගමන්කර මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ බටහිර, දකුණ, නිරිත, දකුණ, නිරිත, ගිණිකොන, දකුණ, ගිණිකොන, දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන, දකුණ හා නිරිත දෙසට ගමන්කර, සබරගමුව පළාතේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**දකුණට :**

සබරගමුව පළාත් සභාවේ උතුරු මායිම ඔස්සේ වයඹ හා නිරිත දෙසට ගමන්කර, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය ද වේ.

**බටහිරට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුරු, වයඹ, ඊසාන හා වයඹ දෙසට ගමන් කර, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය ද දක්වා ද, එතැන් සිට, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිරට මායිම ඔස්සේ වයඹ, ඊසාන, උතුර, බටහිර, උතුර, වයඹ, උතුර, බටහිර, වයඹ, උතුර දෙසට ගමන්කර බඹරකොටුව

## උපලේඛනය I (සම්බන්ධිතයි)

*කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
| --- | --- |
| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය ද දක්වා ද, එතැන් සිට බඹරකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගමන්කර උතුර, බටහිර, ඊසාන, වයඹ, ඊසාන, උතුරු, වයඹ, උතුරු, වයඹ, උතුර ඊසාන, වයඹ, ඊසාන හා වයඹ දෙසට ගමන්කර, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද, එතැන් සිට, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, ඊසාන, වයඹ, ඊසාන හා වයඹ, බටහිර, වයඹ, ඊසාන, වයඹ, ඊසාන හා වයඹ දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍ය දක්වා ද වේ. |

## උපලේඛනය II

*මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍ර* අනුව, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කළ අංක 95/9 හා 1980.07.03 වැනි දින දරන *ගැසට් නිවේදනයෙන්* සඳහන් ප්‍රදේශවලට අමතරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවේ ඉම් හා මායිම් වලින් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ. | **උතුරට :**<br><br>අංක 719 කුඩාකෝවන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිමත්, අංක 708 කෝන්ගස්වල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිමත් ඡේදනය වන ලක්ෂයෙන් පටන්ගෙන එතැන් සිට, මල්ලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිරට මායිම ඔස්සේ ඊසාන, උතුර හා ඊසාන දෙසට ගමන්කර, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන හා දකුණු දෙසට ගමන්කර, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ඊසාන හා ගිණිකොන දෙසට ගමන්කර, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.<br><br>**නැගෙනහිරට :**<br><br>අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණ, ගිණිකොන, දකුණ, ගිණිකොන, වයඹ, නිරිත, ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන, ගිණිකොන, නිරිත, දකුණ, ගිණිකොන, නැගෙනහිර, ගිණිකොන, නිරිත, ගිණිකොන, වයඹ, දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන, නිරිත, ගිණිකොන, ඊසාන, ගිණිකොන, නැගෙනහිර, ඊසාන, නැගෙනහිරට, ගිණිකොන දෙසට ගමන්කර, එතැන් සිට, මධ්‍යම පළාතේ උතුරු මායිම ඔස්සේ, නිරිත, ගිණිකොන, නිරිත, බටහිර, දකුණ හා ගිණිකොන දෙසට ගමන්කර, මහනුවර - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |

උපලේඛනය II (සම්බන්ධිතයි)

*මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

*I වැනි තීරුව*

*II වැනි තීරුව*

**දකුණට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂයේ සිට මධ්‍යම පළාතේ උතුරු මායිම් ඔස්සේ බටහිර, නිරිත, වයඹ, නිරිත, වයඹ, බටහිර, නිරිත, දකුණ, ඊසාන, නිරිත, ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන, දකුණ, ගිණිකොන, නිරිත, දකුණ, ගිණිකොන, නිරිත, දකුණ, ගිණිකොන, ඊසාන, ගිණිකොන, නිරිත, වයඹ, නිරිත, වයඹ හා බටහිර දෙසට ගමන්කර, අංක 662 උග්ගල්පාය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලෙස දක්වා ද වේ.

**බටහිරට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මධ්‍යම පළාතේ, උතුරු මායිම ඔස්සේ ඊසාන, වයඹ, ඊසාන හා වයඹ දෙසට ගමන්කර, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ඊසාන, උතුර, වයඹ, ඊසාන, උතුර, වයඹ, ඊසාන, වයඹ, ඊසාන, වයඹ ඊසාන, උතුර, වයඹ දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍යය දක්ව ද වේ.

උපලේඛනය III

*පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අනුව, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කළ අංක 1148/5 හා 2000.09.04 දින දරන ගැසට් නිවේදනයෙන් සඳහන් ප්‍රදේශවලට අමතරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවේ ඉම් හා මායිම්වලින් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

**උතුරට :**

බමුණුකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම හා කුලියාපිටිය දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැනෙහිරට මායිමත් ඡේදනය වන ලක්ෂ්‍යයෙන් පටන්ගෙන, එතැන් සිට, බමුණුකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ඊසාන, ගිණිකොන, ඊසාන, ගිණිකොන, නැගෙනහිර, ගිණිකොන, ඊසාන, ගිණිකොන, නැගෙනහිර, ඊසාන, වයඹ හා ඊසාන දෙසට ගමන්කර, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද වේ.

**නැගෙනහිරට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන, දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන, නිරිත, ගිණිකොන, නිරිත, ගිණිකොන දෙසට ගමන්කර එතැන් සිට, සබරගමුව පළාතේ බටහිර මයිම ඔස්සේ නිරිත, ගිණිකොන, නිරිත, උතුර, නිරිත, දකුණ, ගිණිකොන හා නිරිත දෙසට ගමන්කර මාඔයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

උපලේඛනය III (සම්බන්ධිතයි)

*පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම*

*I වැනි තීරුව*

*II වැනි තීරුව*

**දකුණට :**

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මාඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, නිරිත, වයඹ, නිරිත හා වයඹ දෙසට ගමන්කර අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යද දක්වා ද වේ.

**බටහිරට :**

අවසන්වරට සඳහන් කල ලක්ෂ්‍යයේ සිට අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, ඊසාන, උතුරු, වයඹ, ඊසාන, ගිණිකොන, උතුර, ඊසාන, වයඹ දෙසට ගමන්කර නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, ඊසාන, වයඹ, නිරිත, වයඹ හා නිරිත දෙසට ගමන්කර කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුර, ඊසාන හා වයඹ දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍ය දක්වා ද වේ.

05- 360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.